**සීමා සහිත ලංකා පොහොර සමාගම - 2019/2020**
---------------------------------------------------

**1.** මූල්‍ය ප්‍රකාශන
--------------

**1.1** තත්ත්වාගණනය කළ මතය
-----------------------------

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය,හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සීමා සහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම
-------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගම අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.
- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මුදල් පොතෙහි සටහන් කරන එක් එක් ගනුදෙනුව අදාළ දිනයේදී ලෙජරයට පිටපත් කිරීම වෙනුවට මාසයක ගනුදෙනුවල එකතුව ලෙජරයෙහි ගිණුම්ගත කිරීම හා ගනුදෙනු රාශියක එකතුවක් සඳහා ජ'නල් වවුචර් සකස් කොට තිබීම හේතුවෙන් ගනුදෙනු දෛනිකව සැසඳීමට නොහැකි වී තිබුණි. | දැනට පවත්වාගෙන යනු ලබන ක්‍රමය වෙනුවට මින් ඉදිරියට දෛනිකව සිදුවන ගණුදෙණු වෙන වෙනම ලෙජරයට පිටපත් කර ගිණුම් වාර්තා සමඟ ලෙජරය විගණනයට යොමු කරනු ලැබේ. | සිදුවන ගනුදෙනු දෛනිකව ලෙජරයට පිටපත් කළ යුතුය. |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) | සමාගම විසින් සෘජුව මිලදී ගන්නා පොහොර වර්ග සමාගම තුළදී අලෙවි කිරීම, මිශ්‍ර කිරීම, කුඩා පැකට් ලෙස සැකසීම, නැවත මළු කිරීම, එක් එක් වර්ගයන් අතර මාරු කිරීම ආදී විවිධ ක්‍රියාවලියන්ට භාජනය වේ. ගිණුම් වර්ෂය තුළ මිලදීගත් සෘජු පොහොර සම්බන්ධයෙන් උක්ත විවිධ ක්‍රියාවලීන්ට ලක් කළ බවට සංඛ්‍යා ඇතුළත් කර අවසන් තොගය ගණනය කර ඇතත්, තොග ගණනයේදී හඳුනාගෙන ඇති පොහොර මෙට්‍රික් ටොන් 101.17 ක තොග ඌනතාවයක් විකුණුම් පිරිවැයට ගලපා නොතිබීම හේතුවෙන් සමාලෝචිත වසරේ ලාභය ආසන්න වශයෙන් රු.5,085,500 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉහත ජේදයේ විගණන වාර්තාවේ සඳහන් පරිදි අවසන් තොග වාර්තා භෞතිකව සත්‍යාපනය කරන අවස්ථාවේදී රජයේ විගණන අංශයේ සහභාගීත්වය ඇතිව එම කටයුතු සිදු වූ බැවින් විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී අවසන් තොග වටිනාකමද නිවැරදිව සටහන්ව තිබෙන බව සඳහන් කරන අතර ඒ අනුව විකුණුම් පිරිවැයද නිවැරදිව තහවුරු වී ඇති බවද සඳහන් කරමි. සමාගම විසින් මිලදී ගන්නා සියළුම පොහොර ලැබීම් අදාළ ගබඩාවට ලැබුණු විගස GRN පතක් මඟින් තොග පොතට ඇතුළු කරනු ලබන අතර, නැවත මළු කිරීම් , මිශ්‍ර කිරීම් හා පැකට් සැකසීම යන ක්‍රියාවලිය සිදු කරන අවස්ථාවේදීම තොග පොතට ගැලපීම් සිදු කරනු ලැබේ. ආයතනයේ මෙම ක්‍රියාවලිය ප්‍රධාන වශයෙන් සිදු වන්නේ හුණුපිටිය ප්‍රධාන ගබඩාවෙන් හා පොළොන්නරුව ගබඩා සංකීර්ණයෙන් පමණි. මෙම ගබඩා සංකීර්ණයේ සිදුවන සියළු ගණුදෙණු සම්බන්ධව තොරතුරු විගණනය සඳහා ඉදිරිපත් කරන ලද අතර තොග සමීක්ෂණ කටයුතු සඳහාද | විකුණුම් පිරිවැය ගණනය කිරීමේදී තොග ඌනතාවයන් ගැලපීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | රජයේ විගණන නිළධාරීන් සහභාගී විය. ඒ අනුව මෙම සියළුම ගබඩාවල තොග පොත් තුලනය කිරීමෙන් අනතුරුව භෞතික තොග ගණනය කරනු ලැබීය. එම නිසා විකුණුම් පිරිවැය සම්බන්ධව නිවැරදිතාවය තහවුරු වූ බවද පෙන්වා දෙමි. | |
| (ආ) | සමාගමේ ප්‍රයෝජනය පිණිස මිලදී ගන්නා සියලුම ද්‍රව්‍ය පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමකට ගිණුම් ගතකොට ගබඩාවට භාර දෙන අතර ගබඩාවෙන් අදාළ අංශය වෙත නිකුත් කරනු ලබන අවස්ථාවේදී අදාළ ද්‍රව්‍යයන් වත්කම් හෝ වියදම් ලෙස හඳුනාගෙන ගිණුම් ගත කිරීමේ ක්‍රමය භාවිතා කරනු ලබයි. ගිණුම් වර්ෂය තුළ පාරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ රු.1,978,401 ක ඌනතාවයක් ඇති වී ඇති අතර ඌනතාවය පිළිබඳ විමර්ශනයන් සිදුකර වගකිව යුත්තන්ගෙන් අයකර ගැනීම වෙනුවට ඌනතාවයේ අගය වත්කම් හා වියදම් ගිණුම් වලට ගලපා තිබුණි. | පරිභෝජන ද්‍රව්‍ය ගිණුමේ තොග ඌනතාවය අවසන් ගිණුම් වලට වත්කම් සහ වියදම් ලෙස ගලපා ඇති බව පිළිගන්නා නමුත් සත්‍ය වශයෙන්ම තොග ඌනතාවයක් සිදු වී නොමැති බව දන්වමි. මෙහිදී සිදු වී ඇත්තේ පාරිභෝජන ද්‍රව්‍ය නිකුත් කිරීම FIFO ක්‍රමයෙන් බැහැරව Average cost ක්‍රමයට භාණ්ඩ නිකුත් කිරීම සහ ඉතිරි වූ පරිභෝජන ද්‍රව්‍ය නැවත ගබඩාවට භාර ගැනීමේදී කිසිදු වටිනාකමක් සඳහන් නොකර තොගය පමණක් භාරගත් බවට සටහන් කිරීම යන ක්‍රම දෙක අනුගමනය කිරීමේදී ඇති වූ තොග වෙනස මත නිරීක්ෂණය වූ ඌනතාවයක් ලෙස පෙන්නුම් කිරීම හේතු කොටගෙනය. මෙම කටයුත්ත ඉදිරි ගිණුම් වර්ෂයේදී සම්පූර්ණයෙන්ම නිවැරදි කිරීමට කටයුතු කරනු ලබන අතර ගබඩාවෙන් නිකුත් කර ඉතිරි වූ පරිභෝජන ද්‍රව්‍ය නැවත ගබඩාවට භාර ගැනීමේදී පරිභෝජන ද්‍රව්‍ය තොග ගිණුමට ගැලපීම වෙනුවට එම තොග වෙනම used stock ලෙස ගලපා ක්‍රියා කිරීමට කටයුතු කරනු ලැබේ. එසේම පරිභෝජන ද්‍රව්‍ය තොග ලේඛණයද FIFO ක්‍රමයට නඩත්තු කිරීමට ක්‍රියා කරනු ලැබේ. | ඌනතාවයට වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඒ අයගෙන් අයකරගත යුතුය. |
| (ඇ) | ලක් පොහොර සමාගමේ ප්‍රධාන කාර්යාලය පිහිටා ඇති වත්තල හුණුපිටිය ඉඩම සමාගම වෙත නීත්‍යානුකූලව පවරා ගැනීමකින් තොරව රු.1,868,965,707 ක අගයකට ප්‍රත්‍යාගණනයකොට ජංගම නොවන වත්කම් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | ජනාධිපති ප්‍රධානයක් හැටියට කැබිනට් තීරණයක් තිබුණු අතර ඒ අනුව 2008 ජනාධිපති ප්‍රධානයක් ලෙස ඔප්පුව ඉඩම් කොමසාරිස් ජනරාල් එවා ඇත. මෙහිදී කැළණිය ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයට අයත් වන පරිදි වෙනම ඔප්පුවක් සහ වත්තලට අයත් වන පරිදි වෙනම ඔප්පුවක් ලෙස ඉඩම් ඔප්පු ලැබුණි. මෙම ඔප්පු එවා ඇත්තේ මීට මාසයකට කලින්ය. කෙසේ වෙතත් මෙය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි නැත. මෙම | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාගම වෙත පවරා ගෙන මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | කටයුත්ත පිළිබඳව අවසන් ගිණුම් වල එළිදරව් කිරීමට කටයුතු කරනු ලබන අතර එය සංශෝධිත ගිණුමේ ඇතුලත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| **(ඇ)** | කොළඹ කටුනායක අධිවේගී මාර්ගය සඳහා මාර්ග සංවර්ධන අධිකාරිය මගින් පවරා ගන්නා ලද කැලණිය ප්‍රාදේශීය ලේකම් යටතේ පවතින පර්චස් **28** ක රජයේ ඉඩම සම්බන්ධයෙන් සමාගම වෙත නීත්‍යානුකූල අයිතියක් නොමැති වුවද ඉඩම් කොටස සඳහා රු.**12,600,000** ක ලැබිය යුතු වන්දි මුදලක් ගිණුම්ගත කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුළ ජංගම වත්කම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලිඛිතව දන්වා ඇති පරිදි රු.මිලයන **12.6** ක මුදල වන්දි වශයෙන් ගෙවන බවට එම ආයතනයෙන් තක්සේරු කර දැනුම් දුන් නමුත් අප ආයතනයට උක්ත ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරු වූ පසු අදාළ මුදල් ගෙවීමට නියමිතය. එබැවින් ඉඩමේ ඔප්පුව ලියාපදිංචි කළ පසුව අදාළ මුදල ලැබිය යුතු බැවින් එම මුදල ලැබිය යුතු මුදලක් වශයෙන් ගිණුම්වල සටහන් කර තිබේ. එසේ වුවද විගණන වාර්තාවේ කරුණු සැලකිල්ලට ගෙන මෙම ලැබිය යුතු මුදල ගිණුම් සටහන් මගින් හෙළිදරව් කොට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය තහවුරුකර ගැනීම. ලැබිය යුතු වන්දිය ගිණුම් සටහනක් මගින් හෙළිදරව් කිරීම. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගමේ පොහොර සැපයුම්කරුවන් සඳහා නියමිත පරිදි ගෙවීමට මහා භාණ්ඩාගරයෙන් අක්මුදල් නොලැබීම හේතුවෙන් බැංකුව මගින් ලබාගත් කෙටිකාලීන ණය මුදලක් මගින් ගෙවීම් නිරවුල් කර තිබුණි. පසුව කෙටිකාලීන ණය මුදල මහා භාණ්ඩාගාරයේ වගකීමට යටත් දීර්ඝකාලීන ණයකට පරිවර්තනය කොට තිබූ නමුත් කෙටිකාලීන ණය සඳහා ගෙවන ලද ණය පොලී අයකර ගැනීම සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරය සමග එකඟතාවයට පත් නොවීම හා කෙටිකාලීන පොලිය දීර්ඝකාලීන ණය මුදලට ඇතුළත් කර ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් භාණ්ඩාගාරයේ වගකීම තහවුරු නොකළ රු.**268,732,450** ක කෙටිකාලීන ණය පොලී මහා | රජයේ පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා මහා භාණ්ඩාගාරය මැදිහත්වීමෙන් සමාගම වෙත ලබාදුන් ණය පහසුකම් වෙනුවෙන් ගෙවිය යුතු පොළිය ගෙවීම් සම්බන්ධයෙන් මහා භාණ්ඩාගාරයේ තීරණ මත කටයුතු කල යුතුය. කාලීන ණයක් ලබා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු පොළී මුදල නැවත කාලීන ණයක් ලෙස පරිවර්තනය කිරීමට ප්‍රායෝගිකව නොහැකි වේ.<br><br>තවද පොළී මුදල් ගෙවීම සම්බන්ධයෙන් අදාළ බැංකුව මගින් තහවුරු කරන ලද ලේඛනයක් සමාගම වෙත ඉදිරිපත් කර ඇති අතර එම ලිපියත් සමඟ පොළී මුදල් ඉල්ලුම් කරමින් මහා භාණ්ඩාගාරය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. එම නිසා කෙටි කාලීන ණය පොළී මහා භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදලක් සේ සලකා අවසන් ගිණුම් සකසා ඇත. | මහා භාණ්ඩාගාරයෙන් වගකීම තහවුරුකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |
| (ආ) | පොහොර ආනයනයේදී දෙපාර්ශවය එකඟ වූ ප්‍රමාණයන්ට වඩා අඩු ප්‍රමාණයක් සැපයුම්කරුවන් විසින් ලබාදී ඇති අවස්ථාවකදී සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකමින් අදාළ අඩු පොහොර තොගයේ වටිනාකම අඩුකොට ගිණුම් තැබිය යුතු වුවත් සැපයුම්කරුගේ ඉන්වොයිස් වටිනාකම මිලදී ගැණුම් ලෙසත් අඩුවෙන් එවා ඇති තොගයේ වටිනාකම ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර තිබුණි. වර්ෂය තුළ ඉන්වොයිස් කළ තොග වටිනාකමට වඩා අඩුවෙන් තොග ලැබීම්වල ලෙස රු.16,861,511ක් ලැබිය යුතු ශේෂයක් ලෙස ගිණුම්ගත කර ඇති අතර වර්ෂාවසානයේ නොපියවූ ලැබිය යුතු ශේෂය රු.6,398,762 ක් විය. උක්ත ලැබිය යුතු ශේෂය අදාළ සැපයුම්කරුට ගෙවිය යුතු ශේෂයට ගලපා නිරවුල් කර ගිණුම්ගත නොකිරීම හේතුවෙන් කෙටිකාලීන බැංකු ණය ලබාගැනීම මගින් උක්ත ශේෂයද සැපයුම්කරු වෙත ගෙවීම් කර නැවත සැපයුම්කරුගෙන් අයකර ගැනීමට සිදු වීමෙන් අතිරේක පොලී වියදමක් දැරීමට සිදු වී ඇති අතර ව්‍යාජ ලැබිය යුතු ශේෂයක් ගිණුම්වල නිරූපණය කර තිබුණි. | ණයවර ලිපිය විවෘත කිරීමෙන් අනතුරුව සැපයුම්කරු විසින් බැංකුවට ඉදිරිපත් කරනු ලබන වාණිජ ඉන්වොයිස්පත සහ නෞව් භාර පත් පදනම් කරගෙන බැංකුව සැපයුම්කරු වෙත මුදල් නිදහස් කිරීම සිදු කරනු ලැබේ. එනමුත් සත්‍ය වශයෙන්ම ලැබුණු තොගය වරායෙන් සහතික කිරීමේදී ඇතිවන වෙනස අප විසින් සැපයුම්කරුගෙන් අයකරගනු ලබන අතර මින් ඉදිරියට යම් බැංකු ගාස්තුවක් අයකර ගැනීමට ඇත්නම් එකී වටිනාකමද සැපයුම්කරුගෙන් අයකරගැනීමට කටයුතු කරනු ලැබේ. | ලැබුණු පොහොර ප්‍රමාණය පමණක් ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | රු. 72,102,543 ක්වූ වෙළඳ ණයගැතියන්ට අදාළ ශේෂ සනාථ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙහි ඉදිරිපත් කර ඇති ගිණුම්වලින් ලැබී ඇති සාක්ෂි සංශෝධිත ගිණුම් වාර්තාව සමඟ ඉදිරිපත් කරමි. | ශේෂ සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රු.4,636,187,820 ක්වූ වෙළඳ හිමියන් හා රු.59,421,950 ක් වූ විවිධ ණයහිමියන්ට අදාළ ශේෂ සනාථ ලිපි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | මෙහි ඉදිරිපත් කර ඇති ශේෂ ගිණුම්වලින් ලැබී ඇති සාක්ෂි සංශෝධිත ගිණුම් වාර්තාව සමඟ ඉදිරිපත් කරමි. | සනාථන ලිපි විගණනයට ඉදිරිපත් කළ යුතුය. |

**1.7** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.3.3 ඡේදය | මහා භාණ්ඩාගාරයෙන් අනුමත කර ගන්නා ලද දිරි දීමනා ක්‍රමයකින් හා ජාතික වැටුප් හා දීමනා ප්‍රතිපත්තීන්ට අනුව විධිමත් අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී එකතු වටිනාකම රු.49,940,295 ක් දිරි දීමනා ලෙස සේවකයන් වෙත ගෙවීම් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දිරි දීමනා ගෙවා ඇත්තේ වරායට පැමිණෙන නැව් තොග ගොඩබෑම කඩිනම් කිරීමේදී නැවත එම නැව් සමාගම් විසින් ලබා දෙන මුදල්ය. මෙම පොහොර තොග කඩිනමින් වරාය තුල ගොඩ බා ගත් පසු අදාළ නැව් සමාගම් නැව් තොග ගොඩ බෑම කඩිනම් කරදීම සඳහා මුදලක් අප ආයතනයට ලබා දී තිබෙන අතර එය සේවකයින්ගේ දිරි දීමනාවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බෙදා දී තිබේ. එසේම මෙම මුදල් සේවකයින් අතර බෙදා දී ඇත්තේ සේවකයින්ගේ කාර්යක්ෂමතාවය මත උපයාගත්<br><br>මුදලින් බවද සඳහන් කරමි.<br>ඉහත 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ PED/12 ට අනුව ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් සඳහන් | මෙම ගෙවීම් නීත්‍යානුකූල නොවූ දීමනා සේ සලකා ක්‍රියා කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කර ඇත්තේ ආයතනයේ ලාභය පදනම් කරගෙන රාජ්‍ය සතු සමාගම් වලට අදාළ තීරණය ගැනීමට අවස්ථාවක් ලබා දී ඇති බවය. ඒ අනුව දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛන උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යොමු කරන ලදි. මේ සම්බන්ධයෙන් පිළිතුරක් නොලැබීම නිසාත් දිරි දීමනා නොගෙවීමට එරෙහිව වෘත්තිය සමිති බලපෑම එල්ලවීම නිසාත් වසර ගණනාවක් ගෙවන ලද මෙම දිරි දීමනාව සභාපතිතුමාගේ අනුමැතිය පරිදි ගෙවන ලදි. | |
| (ආ) | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED/12 සමඟ නිකුත් කරන ලද රාජ්‍ය ව්‍යවසායන්හි යහපාලනය සඳහා වන මාර්ගෝපදේශ සංග්‍රහයේ 06 පරිච්ඡේදය 5.1 වගන්තිය | ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ සෑම රාජ්‍ය සමාගමක්ම මූල්‍ය ප්‍රකාශන සකස්කොට විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් මූල්‍ය වර්ෂය අවසන් වී දින 210 ක් ගත වීමෙන් පසුව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | එම කාලය තුළ කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් රටේ පැවති ඇඳිරි නීති තත්ත්වය මත ගිණුම් වාර්තා ප්‍රමාද විය. මෙය අපගේ ඍජු පාලනයකින් තොරව සිදු වූවක් බවද සඳහන් කරමි. | චක්‍රලේඛ ප්‍රතිපාදන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක PED/1/2015 චක්‍රලේඛය සහ 2016 ඔක්තෝබර් 25 දිනැති අංක PED/1/2015 (i) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 3 වගන්තිය | ප්‍රවාහන පහසුකම් හිමිකම නොමැති කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) වෙත වාහන ලබාදීමකින් තොරව ඉන්ධන ලීටර් 120 ක් සඳහා රු.11,400 ක ඉන්ධන දීමනාවක් ලබාදී තිබූ අතර උක්ත චක්‍රලේඛය තුළින් | ජී.ජී.සමන් මහතා වැ.බ.කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) සතුව වාහනයක් නොමැති බැවින් PED 1/2015 රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය අනුව ප්‍රවාහන හා ඉන්ධන දීමනාවක් ගෙවීම් කල නොහැක. එහෙත් ඔහු | මෙම දීමනා නීත්‍යානුකූල නොවූ වියදම් සේ සලකා ක්‍රියා කළ යුතුය. |

ආවරණය නොවන මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් 09 වෙත චක්‍රලේඛ විධිවිධාන අතික්‍රමණය කරමින් එක් නිලධාරියකු වෙත රු.10,000 බැගින් වන සේ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත රු.1,160,000 ඉන්ධන දීමනා ලබාදී තිබුණි.

කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) තනතුරේ රාජකාරී ආවරණය කරන බැවින් නිල වාහනයක් ලබා ගැනීමට හිමිකම් ලබයි. එහෙත් ඔහු සඳහා සංචිත වාහනයක් යොදවන්නේ නම් එක් දිනකට හුණුපිටියේ සිට බණ්ඩාරගම බැල්ලන්තුඩාව දක්වාත්, නැවත බණ්ඩාරගම බැල්ලන්තුඩාවේ සිට හුණුපිටිය දක්වාත් ගමන් වාර 04 ක් යා යුතුය. ඒ සඳහා වාහනයකට වැය වන වියදම හා රියැදුරන්ගේ අතිකාල සඳහා යන වියදම සැලකිල්ලට ගෙන ඒ සඳහා අවම ඉන්ධන දීමනාව ගෙවීමට කළමනාකාරීත්වය තීරණය කරන ලදි.

ඒ අනුව 2015.12.15 දිනැතිව වැ.බ.කළමනාකරු (ප්‍රසම්පාදන හා ආනයන) වෙත "මාසිකව ප්‍රවාහන දීමනාවක් ලබා දීම" මැයෙන් ඉදිරිපත් කල අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව මඟින් ජී.ජී.සමන් මහතා වෙත පළමු වන ශ්‍රේණියේ කළමනාකරුවන්ට අනුමත මාසික ඉන්ධන දිමනාව ලීටර් 120 පදනම් කරගෙන එවකට පැවති අවම ඉන්ධන දිමනාව වන (ලීටර් 120 x රු.95/- ) රු.11.400.00 ක මුදලක් 2015.12.01 දින සිට ගෙවීමට කටයුතු කරන ලදි.

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක **PED 1/2015** අනුව නිල වාහන හිමි නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අප සමාගමේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් විවිධ ප්‍රදේශයන්හි සිට සේවයට වාර්තා කරනු ලබන බැවින් එසේ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීමේදී ආයතනයට විශාල පිරිවැයක් දැරීමට සිදු වේ. එබැවින් එක් අයෙකු වෙත රු.**10,000.00** දීමනාවක් ලබාදීම ආයතනයට ලාභදායී බැවින් මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා ප්‍රවාහන දීමනාවක් ලෙස රු.**10,000.00** ක මුදලක් ගෙවීමට තීරණය කරන ලදි.

රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක **PED 1/2015** අනුව නිල වාහන හිමි නොමැති මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව අප සමාගමේ මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් විවිධ ප්‍රදේශයන්හි සිට සේවයට වාර්තා කරනු ලබන බැවින් එසේ කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් සැලසීමේදී ආයතනයට විශාල පිරිවැයක් දැරීමට සිදු

| | | |
|---|---|---|
| | | වේ. එබැවින් එක් අයෙකු වෙත රු.10,000.00 දීමනාවක් ලබාදීම ආයතනයට ලාභදායී බැවින් මධ්‍යම මට්ටමේ කළමනාකරුවන් සඳහා ප්‍රවාහන දීමනාවක් ලෙස රු.10,000.00 ක මුදලක් ගෙවීමට තීරණය කරන ලදී. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

**සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.97,993,276 ක ලාභයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ පාඩුව රු.34,506,078 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.132,499,354 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පොහොර විකුණුම් ආදායම වැඩිවීම හා ගැණුම් පිරිවැය අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.**

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහනාධාර ක්‍රමය තුළ වී ගොවිතැන සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලය අනුමත කරන ලද ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා අනුමත ප්‍රමාණයෙන් පොහොර ලබාදීම හැර පොහොර අලෙවි ප්‍රවර්ධනය තුළින් ආදායම් වැඩි කර ගැනීමට වර්තමාන පොහොර බෙදාහැරීමේ ක්‍රමය තුළ සමාගම වෙත අවකාශ නොතිබියදී ලක් පොහොර නමින් ලොකු, කුඩා කුඩ 1,000 ක් මුද්‍රණය කිරීම සඳහා රු.470,000 ක අනාර්ථික වියදමක් සිදු කර තිබුණි. අලෙවි ප්‍රවර්ධනය සඳහා මුද්‍රණය කර ඇති මෙම කුඩ තොගයෙන් කොටසක් සමාගමේ සේවකයන් වෙත නොමිලේ බෙදාහැර ඇති අතර ඉතිරි කුඩ 455 ක් මාස 16 ක් තිස්සේ පාරිභෝගික ද්‍රව්‍ය ගබඩාවේ ගබඩා කර තිබුණි. | අප සමාගමේ ස්ථිර තොග නිළධාරීන් සහ ආරක්ෂක නියාමකයින් වෙත රාජකාරී කටයුතු සඳහා පහසුකම් වශයෙන් වසරකට විදුලි පන්දමක්, කුඩයක් සහ වැහි කබායක් ලබා දෙන ලදී. මෙම කුඩය සාමාන්‍ය වෙළඳපොලේ ඇති කුඩයක් වෙනුවට අප සමාගමේ ලෝගුව මුද්‍රණය කරන ලද කුඩයක් ඒ සඳහා මිලදී ගෙන බෙදාදීමට කටයුතු කරන ලදී. තවද තරගකාරී විවෘත වෙළඳපොලේ පොහොර අලෙවිය සිදුවන කාලයේ ඉතාමත් අවම පිරිවැයක් යටතේ ප්‍රචාරණ කටයුත්තක් ලෙස මෙම කුඩ මුද්‍රණය කර අලෙවි නියෝජිතයන් වෙත නොමිලේ ලබා දීමට කටයුතු කරන ලදී. මේ වන විටත් අප සමාගමේ ලක්පොහොර නාමය වෙළඳපොලේ ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය ඇති බැවින් ඉතාමත් අවම පිරිවැයක් යටතේ සියළුම සේවකයින්ට සහ කෘෂිකර්මාන්තයට සම්බන්ධ උත්සව වලදී අප සමාගමේ අනුග්‍රාහකදායකත්වයක් ලෙස මෙම | සහනාධාර ක්‍රමය තුළ අලෙවි ප්‍රවර්ධන ක්‍රමය සඳහා වියදම් දැරීම සිදු නොකිරීමට කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | කුඩ ප්‍රදානය කිරීමෙන් ප්‍රචාරණයක් ලබා ගැනීම ප්‍රධාන අපේක්ෂාව වේ. එබැවින් හුදෙක් මෙය අපගේ සන්නම් නාමය වෙළඳපොල තුල ආරක්ෂා කර ගැනීමට සකසන ලද්දක් වන අතර, අනාර්ථික වියදමක් නොවේ. | |

**3.2** හඳුනාගත් පාඩු

---------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සහනාධාර පොහොර තොග නිසි කළමනාරණයෙන් යුක්තව බෙදාහැරීමට කටයුතු නොකිරීම හේතුවෙන් පසුගිය ගිණුම් වර්ෂය තුළ රු.**40,288,200** ක් පමණ වටිනා පොහොර මෙ.ටො **671.47** ක් හා ගිණුම් වර්ෂය තුළ රු.**13,526,400** ක් වටිනා සහනාධාර පොහොර මෙ.ටො **225.44** ක් ගොවීන් වෙත බෙදාහැරීමට නොහැකි ලෙස හානියට පත්වීම හේතුවෙන් රජයට සිදු වී ඇති මුළු අලාභය රු.**53,814,600** ක් විය. | වසර **05** ක පමණ කාලයක සිට අප සමාගම විසින් ආනයනය කරන ලද සහනාධාර සහ සහනාධාර නොවන මුළු පොහොර තොග ප්‍රමාණය මෙ.ටො.**1,250,000** කට වැඩි ප්‍රමාණයක් වේ. මෙසේ වසර **05** ක සිට විවිධ හේතූන් මත, එනම්<br>**1.**නැව් වලින් ලද අතිරික්ත ඇමදුම් පොහොර **(Sweeping )**<br>**2.**මෙහෙයුම් කටයුතු වලින් ඉවත් වන ඇමදුම් පොහොර<br>**3.**ස්වාභාවික ආපදා වලින් හානි වූ පොහොර<br>**4.**උසාවි මඟින් අප සමාගම වෙත භාර දී ඇති පොහොර තොග<br>**5.**කල් ඉකුත් වූ පොහොර තොග මේ ආකාරයට පොහොර ගබඩාවලින් නිකුත් නොවී ඉතිරිව තිබූ පොහොර තොග ප්‍රධාන ගබඩා සංකීර්ණයේ වෙනම ස්ථානයක ගබඩා කර ඇත. මෙම පොහොර තොග සම්බන්ධයෙන් ගබඩා ඉඩකඩ ඇහිරී තිබීම නිසා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අමාත්‍යාංශයේ ලේකම්තුමාගේද අනුමැතිය ඇතිව රජය විසින් පවත්වාගෙන යනු ලබන ගොවිපලවල් , ත්‍රිවිධ හමුදාව සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව සහ බන්ධනාගාර වැනි රාජ්‍ය ආයතන වෙත නොමිලේ නිකුත් කිරීමට කටයුතු කරන ලදී.<br>මෙම පොහොර තොග වලින් මිශ්‍රන සඳහා ලබාගත හැකි උපරිම ප්‍රමාණය ප්‍රයෝජනයට ගත් පසු කිසිසේත්ම විකිණීමට නොහැකි මෙම තොග කාබනික පොහොර මුහුණුවරකින් රසායනික පොහොර මිශ්‍ර කර පොහොර වර්ග සැකසීමට සුදුසු ක්‍රමවේදයක් සහ පොහොර පනතට | සමාගමට අලාභයක් සිදු නොවන පරිදි කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | අනුව එවැනි පොහොර නිෂ්පාදනය කිරීමට බලතල අප සමාගම සතුව නොමැත. තවද රු.මිලයන **53.8** ක අලාභයක් සඳහන් වූ බව සඳහන් වුවත් එය බෙදාහැරීමේ අකාර්යක්ෂමතාවක් මත සිදු වූවක් නොවන බව පෙන්වා දිය හැක. | |

**3.3** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වසරේ ලාභය හා නැව් නිෂ්කාශන ආදායම පදනම් කර ගනිමින් **2020** මාර්තු මස මූලික වැටුප හා ජීවන වියදම් දීමනා මත මාස **03** ක දිරි දීමනාවක් ගෙවීම සඳහා පිළිවෙලින් **2020** මාර්තු මස **20** දින හා **2020** සැප්තැම්බර් **25** දිනයන්හි අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකා **02** ක් ඉදිරිපත් කර තිබුණි. අවස්ථා දෙකෙහිදීම නැව් නිෂ්කාශන ආදායමින් **60%** ක් නොඉක්මවන පරිදි වාර්ෂික දිරිදීමනා ගෙවීම් කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය අනුමැතිය ලබාදී ඇතත් ඊට අනුකූල නොවන සේ නැව් නිශ්කාශන ආදායම සැලකිල්ලට ගැනීමකින් තොරව **2020** මාර්තු මස ගෙවා තිබූ මූලික වැටුප හා ජීවන වියදම් දීමනාව පදනම් කර ගනිමින් මාස **03** ක වැටුපක් දිරිදීමනා ලෙස ගෙවීම් කර තිබුණි. අධ්‍යක්ෂමණ්ඩල තීරණය අනුව ගෙවීම් සඳහා අනුමත කර තිබූ උපරිම දිරි දීමනා ප්‍රමාණය (නැව් නිෂ්කාශන ගාස්තුව***60%= රු.44,407,138*60%)** රු.**26,644,282** කි. එහෙත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූල නොවන සේ එකතුව විටිනාකම රු.**49,940,295** ක දිරි දීමනා ගෙවීම් කිරීම හේතුවෙන් රු.**23,296,013** ක මුදලක් අනුමැතියකින් තොරව දිරි දීමනා ලෙස ගෙවීම් කර තිබුණි. | සමාලෝචිත වර්ෂයේ දිරි දීමනා ගෙවා ඇත්තේ වරායට පැමිණෙන නැව් තොග ගොඩබෑම කඩිනම් කිරිමේදී නැවත එම නැව් සමාගම් විසින් ලබා දෙන මුදල්ය. මෙම පොහොර තොග කඩිනමින් වරාය තුල ගොඩ බා ගත් පසු අදාළ නැව් සමාගම් නැව් තොග ගොඩ බෑම කඩිනම් කරදීම සඳහා මුදලක් අප ආයතනයට ලබා දී තිබෙන අතර එය සේවකයින්ගේ දිරි දීමනාවක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බෙදා දී තිබේ. එසේම මෙම මුදල් සේවකයින් අතර බෙදාදී ඇත්තේ ආයතනය සේවකයින්ගේ කාර්යක්ෂමතාවය මත උපයාගත් මුදලින් බවද සඳහන් කරමි.<br>ඉහත **2003** ජුනි **02** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ **PED/12** ට අනුව ප්‍රසාද දීමනා සහ දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් සඳහන් කර ඇත්තේ ආයතනයේ ලාභය පදනම් කරගෙන රාජ්‍ය සතු සමාගම් වලට අදාළ තීරණය ගැනීමට අවස්ථාවක් ලබා දී ඇත. ඒ අනුව දිරි දීමනා ගෙවීම සම්බන්ධයෙන් අදාළ චක්‍රලේඛන උපදෙස් පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යොමු කර මහා භාණ්ඩාගාරයෙන් අනුමැතිය ලබා ගැනීමට ලිපියක් යොමු කරන ලදි. මේ සම්බන්ධයෙන් පිළිතුරක් නොලැබීම නිසා දිරි දීමනා නොගෙවීමට එරෙහිව වෘත්තිය සමිති බලපෑම එල්ලවීම නිසා වසර ගණනාවක් ගෙවන ලද මෙම දිරි දීමනාව එවකට සිටි සභාපතිතුමාගේ අනුමැතිය පරිදි ගෙවන ලදි. නමුත් මේ වන විට මෙම දිරි දීමනාව ගෙවීම සම්බන්ධව පැහැදිලි උපදෙස් ලැබී ඇති බැවින් ඉදිරියේ උපදෙස් පරිදි කටයුතු කරනු ලැබේ. | අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූල නොවන ගෙවීම් නීත්‍යානුකූල නොවූ වියදම් සේ සලකා ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගමේ කළමනාකාරීත්වය ගිණුම් වර්ෂය තුළ කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණ කිරීමට අපොහොසත් වීම හේතුවෙන් රු.66,858,564 ක බැංකු අයිරාවක් වෙනුවෙන් රු.572,290 ක වළක්වාගත හැකිව තිබූ ණය පොලී වියදමක් දැරීමට සිදු වී තිබුණි. | සමාගමේ බැංකු කටයුතු මහජන බැංකුව හා ලංකා බැංකුව සමඟ සිදු කරනු ලැබේ. 2020 මාර්තු 06 වන දින ලංකා බැංකු ආයතනික ශාඛාවේ සිදු වූ වැඩ වර්ජනය හේතුවෙන් එදින ගිණුමට බැර විය යුතු මුදල් බැංකු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් බැර නොවූ අතර ඒ සඳහා බැංකුව විසින් රු. 565,530.41 ක බැංකු අයිරා පොළියක් සමාගමේ ගිණුමට හර කරන ලදි. මෙය බැංකුවෙන් සිදුවූ අතපසු වීමක් හේතුවෙන් ජනිත වූ බැංකු අයිරා පොළියක් බැවින් මෙය බැංකුව විසින් නිවැරදි කල යුත්තකි. මේ සම්බන්ධයෙන් 2021.03.03 දිනැති ලිපිය මඟින් බැංකුව දැනුවත් කර ඇති අතර මෙම බැංකු අයිරා පොළී මුදල ආපසු සමාගමේ බැංකු ගිණුමට බැර කිරීමට කටයුතු සිදු කරන බවට සමාගම වෙත දැනුම් දී ඇත. එබැවින් සමාගමේ කාරක ප්‍රාග්ධනය මැනවින් කළමනාකරණය සිදු කර ඇති බවත් මෙය බැංකුවේ සිදුවූ අතපසු වීමක් බවත් වැඩි දුරටත් දන්වමි. | ණය පොලී වියදම් අවමකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ගිණුම් වර්ෂය තුළ ආනයනය කරන ලද ණයවර ලිපි 04 කට අදාළ TSP මෙ.ටො 11,024.25 ක් (රසායනාගාර වාර්තා අසමත් වීම හේතුවෙන්) ගොවි ජනතාව වෙත නිකුත් කිරීමට ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි අනුමැතිය ලැබී නොතිබුණි. කෙසේ නමුත් රසායනාගාර වාර්තා නිකුත් වීමට පෙර අනුමැතියකින් තොරව සමාගම විසින් උක්ත පොහොර තොග ගොවි ජනතාව වෙත බෙදා හැර තිබුණි. ලක්පොහොර සමාගම විසින් ගොවීන් වෙත බෙදාහරින ලද උක්ත ප්‍රමිතියෙන් තොර පොහොර තොග සඳහා පොහොර සහනාධාර මුදල් ගෙවීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය නිර්දේශ කර නොතිබූ නමුත් පොහොර සඳහා ගෙවිය යුතු දිනට කෙටිකාලීන බැංකු ණයක් මගින් ගෙවීම් පියවා පසුව මහා භාණ්ඩාගාරයේ වගකීම සහිතව දිගු කාලීන ණය මුදලකට පරිවර්තනය | අප සමාගම සහනාධාර පොහොර ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන්නේත් එසේ ආනයනය කරන ලද පොහොර ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත ලබා දෙනු ලබන්නේත් ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ලබාදෙන බෙදාහැරීමේ සැලැස්ම මත පමණි.<br>එසේ ආනයනය කරන ලද පොහොර ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් නියැදි ලබාගෙන පරීක්ෂා කොට එකී පොහොර වල ගුණාත්මකභාවය සහ වසවිසෙන් තොර බව සනාථ කොට පමණක් අප ආයතනයට ඉහත කී පරිදි බෙදාහැරීමට උපදෙස් ලබාදිය යුතුව ඇත.<br>කෙසේ වෙතත් 2019 වර්ෂයේ දී ආනයනය කරන ලද ටී.එස්.පී පොහොර වල නියැදි ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් ලබාගත්තද ඊට අදාලව රසායනාගාර වාර්තා නිසි වේලාවට ලබා ගැනීමට ඔවුන් හට තිබූ අපහසුව මත ඔවුන් අප සමාගමට ලබා දියයුතු අලෙවි අනුමැතිය ඉදිරියේදී | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය නොමැති පොහොර ගොවීන් අතරේ බෙදා නොහැරිය යුතුය. |

කොට විධිමත් අනුමැතියකින් තොරව සහනාධාර මුදල් ලබා ගැනීමට සමාගම කටයුතු කර තිබුණි.

(Marketing Apprival) ලබාදෙන පොරොන්දුව මත ඔවුන් විසින්ම සමාගම වෙත ලබාදී ඇති බෙදාහැරීමේ සැලැස්මට අදාලව පොහොර හිඟයක් ඇති වීමට ඉඩ නොදී ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත මෙම පොහොර ලබා දීමට උපදෙස් දෙන ලදී. ඒ ආකාරයෙන්ම එවකට ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාද අප ආයතනයට ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය ලැබෙන තෙක් පොහොර නිකුත් කරන ලෙස කළ දැඩි ඉල්ලීම ද සලකා බලා අප සමාගම විසින් මෙම පොහොර බෙදාහැරීම් කටයුතු සිදු කරන ලදී.

එවකට උපදෙස් ලබාදුන් නිලධාරීන් වෙනත් ආයතන වලට මාරු වී ගියපසු අලුතින් පත්වීම් ලද නිලධාරීන් විසින් ඉහත බෙදාහැරීම් සිදුකර මාස 13කට පසු එම ටී. එස්. පී. පොහොර වලට අදාල රසායනාගාර වාර්තා ඉදිරිපත් කර උක්ත පොහොර ප්‍රමිතියෙන් තොර බව දන්වන ලදී. මෙසේ ලබාදුන් පොහොර අනුමැතියකින් තොරව ලබාදුන් බව පොහොර ලේකම් කාර්යාලය සඳහන් කලද එහි සියළුම වගකීම් ජාතික පොහොර ලේකම් කාර්යාලය භාරගත යුතුය.

එකම නෞකාවේ සමාගම් කිහිපයක් විසින් ආනයනය කරන ලද එකම සැපයුම්කරුගේ ටීඑස්පී තොගයෙන් අප සමාගමට ලැබුණු පොහොර තොගවල රසායනාගාර වාර්තා අසමත් වීමටත් අනෙකුත් සමාගම්වල රසායනාගාර වාර්තා සමත් වීම පිළිබඳවත් මතු වූ ගැටළුවේදී සිදු කරන ලද විමර්ශනයට අනුව රසායනාගාර වාර්තා සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිළධාරින් 03 දෙනෙකුගේ වැඩ තහනම් කර ඇත. ඒ අනුව අප සමාගම විසින් ආනයනය කරන ලද පොහොර තොග ගොවීන් වෙත බෙදාහැරිමට කටයුතු කල අතර මේ වන විටත් ගොවීන් එම පොහොර යොදා එම නිෂ්පාදන ලබා ගෙන ඇත. ඒ වෙනුවෙන් දරන ලද පරිහරණ

| | | | |
|---|---|---|---|
| | | වියදම් හා අනෙකුත් වියදම් සමාගම විසින් ආයතනයට පාඩුවක් නොවන ලෙස මහා භාණ්ඩාගාරයෙන් ඉල්ලුම් කොට ඇත. | |
| (ඇ) | රසායනික පොහොර භාවිතය අඩු කොට කාබනික පොහොර භාවිතය ප්‍රචලිත කිරීම සඳහා නුවර, නුවරඑළිය දිස්ත්‍රික්කයන්හි රසායනික පොහොර ප්‍රතිපාදනය **25%** කින් අඩුකර කාබනික හා මිශ්‍ර පොහොර ලබාදීමට ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් උපදෙස් ලබා දී ඇතත් ඊට අනුරූපීව කාබනික පොහොර හා මිශ්‍ර පොහොර නිෂ්පාදනය හා බෙදාහැරීම සඳහා සමාගම විධිමත් වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | රසායනික පොහොර භාවිතය අවම කර, කාබනික පොහොර ප්‍රචලිත කිරීමේ රජයේ ප්‍රතිපත්තීන්ට අනුකූල වෙමින් කාබනික පොහොර, වෙළඳපොලට නිකුත් කිරීම සඳහා අපට අවශ්‍ය ධාරිතාවය අඛණ්ඩව සැපයිය හැකි නියමිත තත්ත්වය සහ උචිත මිල ගණන් පවත්නා ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අනුමැතිය ලත් එකම කාබනික පොහොර නිෂ්පාදන ආයතනය වන **Hyosung ONB** ආයතනය තෝරා ගන්නා ලද අතර, ඔවුන් සමඟ අවබෝධතා ගිවිසුමකට එළඹ **2016** වසරේ සිට අවශ්‍ය කාබනික කැට පොහොර, වෙළඳපොලට නිකුත් කිරීමට කටයුතු කරන ලදි. මීට අමතරව ආයතනයේ රසායනාගාරයේ පරීක්ෂණයට ලක්ව ප්‍රසම්පාදන ක්‍රියාවලිය යටතේ තෝරා ගත් තවත් ආයතන කිහිපයක් හා කොම්පෝස්ට පොහොර මෙන්ම කාබනික දියර පොහොරද ගෙන්වා වෙළඳපොල අවශ්‍යතාවය අනුව පොහොර නිකුත්කිරීමේ කටයුතු අප සමාගම විසින් අඛණ්ඩව සිදු කරනු ලැබීය. එමෙන්ම නාගරික අපද්‍රව්‍ය කළමනාකරණ ආයතනය සමඟ එක්ව අවබෝධතා ගිවිසුම් සඳහා සාකච්ඡා වට කිහිපයක් පැවැත්වූ අතර කාබනික පොහොර මෙ.ටො. **20** ක් ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලයේ මහාචාර්ය ප්‍රියන්ත යාපා මහතා සම්බන්ධ කර ගනිමින් නිෂ්පාදනය කිරීමටද කටයුතු කරන ලදි. කෙසේ වෙතත් ලංකා පොහොර සමාගම මඟින් රසායනික පොහොර පමණක් අලෙවි කල යුතු බවටත් සහ ආයතන දෙකම ඒකාබද්ධ කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙසටත් සඳහන් කරමින් කැබිනට් මණ්ඩල තීරණ දැනුම් දී ඇති බැවින් ඒ සඳහා සුදුසු අවසන් තීරණයකට එළඹෙන තෙක් අප විසින් රසායනික පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලියට | ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් පරිදි කාබනික පොහොර නිෂ්පාදනය සඳහා වැඩපිළිවෙලක් සකස් කළ යුතුය. |

ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරන ලදි. නමුත් Hyosung ONB ආයතනය හා එක්ව කාබනික කැට පොහොර බෙදාහැරීමේ කටයුතු ද මේ දක්වා සිදුකරන අතර එමඟින් රජයේ කාබනික පොහොර ප්‍රවර්දන වැඩසටහනට පූර්ණ දායකත්වයක් සපයා ඇත.

(ඉ) ගිණුම් අංක 2019/MOA/CRC/UR(G)/04/01 හා ගැණුම් ඇණවුම් අංක 814 යටතේ MV Alby Meloty නෞකාවෙන් යූරියා මෙ.ටො 14250 ක් ආනයනය කර තිබුණි. නෞකාවෙන් පොහොර තොග ගොඩබාන අතරතුර නෞකාව තුළ පොහොර ගල්ගැසී, දුර්වර්ණ වී තිබීම හේතුවෙන් සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා සමග එකඟතාවයෙන් කැළණිය පෙතියාගොඩ ප්‍රදේශයේ ගබඩාවක ගබඩාකොට දෙපාර්ශවයේ එකඟතාවයෙන් පත්කරන ලද පරීක්ෂණ කමිටුවක නිර්දේශය මත හුණුපිටිය ලක් පොහොර සමාගමේ ගබඩා කර පසුව ගොවීන් වෙත බෙදාහැර තිබුණි. දෙපාර්ශවය අතර ඇතිකර ගත් ගිවිසුම ප්‍රකාරව අපේක්ෂිත තත්ත්වයේ පොහොර ලැබී නොමැති අවස්ථාවකදී පොහොර තොගය ප්‍රතික්ෂේප කිරීමේ හැකියාව තිබියදී එසේ සිදු කිරීම උක්ත ගනුදෙනුව සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය දැනුවත් නොකිරීම, ගල්ගැසී, දුර්වර්ණ වී තිබූ පොහොර තොග සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලය මගින් රසායනාගාර පරීක්ෂාවක් සිදු කරවා නොගැනීම හා ඒකාබද්ධව සිදු කෙරුණු පරීක්ෂණය සඳහා ජාතික පොහොර ලේකම් කාර්යාලයෙහි නියෝජිතයෙකු ඇතුළත් කර නොගැනීම හේතුවෙන්, පොහොර තොගය සම්බන්ධයෙන් සිදු කළ යුතු අත්‍යාවශ්‍ය ක්‍රමවේදයන් නොසලකා සමාගමේ

Mv Alby Melady නෞකාවෙන් ලැබුණු යූරියා මෙ.ටො.14,250 ක ප්‍රමාණයක් වරායෙන් ගොඩබාමින් සිටින අතරතුර අදාළ පොහොර වල නියැදි ලබාගෙන රසායනාගාර වාර්තාව සහ ජාතික පොහොර ලේකම් කාර්යාලයෙන් අලෙවි අනුමැතිය ලබාගත් පසු සහනාධාර පොහොර තොග බෙදාහැරීමට කටයුතු සිදු කරන ලදි. නෞකාව තුල යූරියා මෙ.ටො. 8500 ක ප්‍රමාණයක මෙහෙයුම් කටයුතු සිදුවන අතරතුර වර්ෂාවක් ඇදහැලුනු අතර නෞකාවේ ආවරණ දොරටු වැසීම ප්‍රමාද වීම හේතුවෙන් නෞකාවේ අසුරා තිබූ පොහොර තොගයේ ඉහළ කොටස වර්ෂාවට හසු විය. එම අවස්ථාවේදී සියළු මෙහෙයුම් කටයුතු තාවකාලිකව අත්හිටුවන ලදි. මීට පෙර මෙවැනි සිදුවීම් වලදී ක්‍රියාකල ආකාරයට ගිවිසුමේ සඳහන් පරිදි සැපයුම්කාර සමාගම සහ අප සමාගම නියෝජනය වන පරිදි ස්වාධීන සමීක්ෂණ කමිටුවක් පත් කර හානියට පත් පොහොර වල වෙන වෙනම නියැදි ලබා ගෙන රසායනාගාර වාර්තා ලබාගන්නා ලදි. එම රසායනාගාර වාර්තාවලට අනුව නෞකාවේ ඉහළ කොටසේ අතුරා තිබූ පොහොර ඇසුරුම්වල තිබිය යුතු ජල වාෂ්ප ප්‍රතිශතය අදාළ ප්‍රමිති අගයට සාපේක්ෂව සුළු ප්‍රමාණයක වැඩි අගයක් ගෙන තිබූ අතර පහළ කොටසේ අතුරා තිබූ පොහොර තොගයට කිසිදු හානියක් සිදු වී නොතිබුණි. මෙම ගැටළුව සම්බන්ධයෙන් තවදුරටත් විමර්ශනයට ලක්කරන තුරු නෞකාවේ ප්‍රමාද ගාස්තු සහ දිවයිනේ යූරියා අවශ්‍යතාවය, ප්‍රසම්පාදන ක්‍රියාවලියට අනුව තොග ලැබීමට නියමිත දින

ප්‍රමිතියෙන් තොර පොහොර ආනයනය, ගොඩබෑම, ගබඩා කිරීම හා බෙදාහැරීම නොකළ යුතුය.

| | | | |
|---|---|---|---|
| | කළමනාකරණය ක්‍රියාකර ඇති බව නිරීක්ෂණය විය. | සැලකිල්ලට ගෙන සැපයුම්කරුගෙන් සියළු වියදම් අයකර ගැනීමේ එකඟතාවය මත අප සමාගමේ නිළධාරින්ගේ අධීක්ෂණය යටතේ අදාළ පොහොර තොග ගොඩ බෑමත් කුලී පදනම මත ලබාගත් බාහිර ගබඩාවක අදාළ පොහොර තොග ගබඩා කිරීමටත් කටයුතු කරන ලදි. (මෙම නෞකාවෙන්ම අනෙකුත් රාජ්‍ය සමාගම වන කොළඹ කොමර්ෂල් පොහොර සමාගමටද යූරියා තොගයක් ලැබී තිබූ අතර එම සමාගමද මෙම පියවර අනුගමනය කර තිබුණි.) අනතුරුව හානියට පත්ව තිබූ පොහොර තොග හඳුනාගෙන එම තොගය ඉවත් කර නිසි පරිදි නැවත සකස් කරන ලද පොහොර තොග භාරගෙන ගොවීන් වෙත බෙදාහැරීමට කටයුතු කරන ලදි. නැවත මළු සකස් කිරීමේදී හඳුනාගත් භාවිතයට ගත නොහැකි පොහොර වෙනම ගබඩාවක මේ වන තෙක් ගබඩා කර ඇති අතර ඊට අදාළ සම්පූර්ණ වියදම සහ අලාභය (මිලියන 13.32) අදාළ සැපයුම්කරුගෙන් අයකරගැනීමට සමාගම කටයුතු කර ඇත. මේ සම්බන්ධයෙන් අප සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කර ලබාගත් අතර අනුමැතිය ප්‍රධාන ගණන් දීමේ නිළධාරියා වන කෘෂිකර්ම අමාත්‍යතුමාගේ ලේකම්තුමාව ලිඛිතව දැනුවත් කරන ලදි. මෙම පොහොර තොගය බෙදාහැරීමෙන් පසුව පරිහරණය කරන ලද ගොවීන්ගෙන් පොහොර වල ප්‍රමිතිය සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක්ද ලැබී නොමැත. | |
| (ඊ) | ගබඩා සේවකයන් සඳහා රු.10,530 ක් හා කාර්යාලගත සේවකයන් සඳහා රු.7,938 ක් ලෙස එකතු වටිනාකම රු.4,813,131 ක් වාර්ෂික ඇඳුම් දීමනාව ලෙස ගෙවීම් කර තිබුණද මේ සඳහා පදනම් වූ නෛතික ප්‍රතිපාදන විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | සමාගමේ සේවක හවතුන් සඳහා නිල ඇඳුම් නොසපයන බැවින් මෙම සමාගම, සංස්ථාවක්ව පැවති කාලයේ සිට ඇඳුම් දීමනාවක් ලෙස ගෙවීම් කර ඇත. ඍජුවම පොහොර ආශ්‍රිතව කටයුතු කරනු ලබන සේවකයින් සඳහා වැඩි මුදලකුත් කාර්යාලීය සේවක හවතුන් සඳහා සාපේක්ෂව අඩු මුදලකුත් වාර්ෂිකව ගෙවීම් කරනු ඇත. එහිදී මෙම දීමනාව ගෙවීම් ආරම්භ කරන ලද කාලසීමාවේ සිට දෙවසරකට වරක් පැවති අගය | පවතින නීති රීති සහ රෙගුලාසිවලට පරිබාහිර දීමනා නොගෙවිය යුතුය. |

වෙළඳපලහි පවතින රෙදිපිළි මිළ ඉහල යාමට සාපේක්ෂව යම් ප්‍රතිශතයකින් වැඩිකර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පරිදි ගෙවීම් කර ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය නෛතික පදනම ලෙස පෙන්වා දිය හැක. සමාලෝචිත වර්ෂයේ ගෙවීම් කල ප්‍රමාණයන් ඒ අනුව තීරණය වී ඇත.

## 3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම පිරිවැය අඩු බෙදාහැරීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමකින් තොරව හා ගබඩා අවශ්‍යතාවය හඳුනාගැනීමකින් තොරව දිවයිනේ විවිධ ප්‍රදේශයන්හි ගබඩා **46** ක් පවත්වා ගෙන යාමට හා ඒ තුළින් වැටුප්, පරිපාලන, මෙහෙයුම් හා ප්‍රවාහන වියදම් අත්‍යාවශ්‍ය නොවන ලෙස ඉහළ නංවා ගැනීම හේතුවෙන් ප්‍රධාන මෙහෙයුම් කටයුත්ත වන පොහොර බෙදාහැරීම තුළින් අඛණ්ඩව මෙහෙයුම් අලාභ ලබා තිබුණි. | රජයේ සහනාධාර පොහොර යල සහ මහ කන්නය සඳහා අවශ්‍යතාවයෙන් **60%** ක ප්‍රමාණය මෙ.ටො. **220,000** ක් පමණ වේ. ඊට අමතරව අනෙකුත් බෝග සහනාධාර පොහොර සඳහා මෙ.ටො.**50,000** ක පමණ තොගයක් වසර පුරා බෙදාහැරීම් කටයුතු කරනු ලබයි. ඒ අනුව හුණුපිටිය ප්‍රධාන ගබඩා සංකීර්ණයේ ගබඩා ධාරිතාවය මෙ.ටො. **67,000** ක් පමණ වන අතර ප්‍රාදේශීය පොහොර ගබඩා **45** ට අදාළව ගබඩා ධාරිතාවය මෙ.ටො. **58,000** ක් පමණ වේ. ඒ අනුව මුළු ගබඩා ධාරිතාව මෙ.ටො. **125,000** කට ආසන්න වේ. දිවයිනට ලැබෙන වර්ෂාවේ ස්වභාවය මත මහ සහ යල කන්නවල ආරම්භය සමහර අවස්ථාවලදී දින උපකල්පනය කල නොහැකි වේ. ඒ මත සහනාධාර පොහොර ඉල්ලුම තීරණය වේ. නමුත් රාජ්‍ය සමාගමක් ලෙස මෙම පොහොර තොග අදාළ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ආනයනය කරනු ලබයි. සමහර කන්නවලදී වර්ෂාව ලැබීම ප්‍රමාද වූ විට පොහොර නිකුත් නොවන අවස්ථාවලදී ආනයනික සැලැස්මට අනුව ලැබෙන පොහොර තොග දිවයිනට ලැබුණු පසු එම තොග ගබඩා කිරීමට ප්‍රමාණවත් ඉඩකඩ නොමැති අවස්ථාවලදී කුලී පදනම මත බාහිර ගබඩා ලබා ගැනීමටද සිදුව ඇත. පසුගිය වර්ෂයකදී මේ සඳහා මිලියන **1.6** ක මාසික කුලියක් යටතේ මාස **03** ක කාලයක් සඳහා රු.මිලයන **4.8** ක මුදලක් වැය වූ අවස්ථාවකදී විගණනයෙන් ඒ සම්බන්ධයෙන් ද විමසීම් සිදු කරන ලදි. | සමාගම පිරිවැට අඩු බෙදාගැනීමේ ක්‍රමවේදයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතුය. |

තවද ප්‍රාදේශීය කෘෂිකර්ම කමිටු රැස්වීම් වලදී , කන්න රුස්වීම් වලදී ප්‍රාදේශීය ලේකම්වරු , දිසාපතිවරු ,ගොවිජන සේවා නිළධාරීන් ගොවි සංවිධාන හිභයකින් තොරව පොහොර ලබා ගැනීමට කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන රජයේ වගකීම ඉටු කිරීමේ අරමුණින් එකී පදනමට ප්‍රාදේශීය ගබඩා ස්ථාපිත කර ඇත. ඒ අනුව මුළු දිවයිනම ආවරණය වන පරිදි වර්ග කිලෝ මීටර් 30 ක් ඇතුලත සියළුම ගොවිජන සේවා (ගොවිජන සේවා 375) ආවරණය වන පරිදි විද්‍යාත්මක ක්‍රමයකට මෙම ගබඩා ස්ථාපිත කර ඇත. කිසිදු පෞද්ගලික හෝ රාජ්‍ය ආයතනයකට නොමැති මෙම පොහොර බෙදාහැරීමේ ගබඩා ජාලය රජයේ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමේදී **STREGIC PLAN** (රජය සතු උපාය මාර්ගික සම්පතක්) ලෙසද නිර්දේශනය වී ඇත. එම නිසා මෙම ප්‍රාදේශීය ගබඩා පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය කරුණක් ලෙස පෙන්වා දිය හැක.

### 3.5 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආනයනික පොහොර තොග සම්බන්ධයෙන් ලබාගත් රසායනාගාර පරීක්ෂණ වාර්තා අසමත් වීම හේතුවෙන් පොහොර, ආනයනික පොහොර සමාගම් 02 කට අදාළ එකතු වටිනාකම ඇමරිකානු ඩොලර් 589,587.5 ක කාර්යසාධන බැඳුම්කර 03 ක් අයකර ගැනීමට සමාගම කටයුතු කර තිබූ අතර ඊට එරෙහිව සැපයුම්කරුවන් බේරුම්කරණයට යොමු වී තිබූ අතර බේරුම්කරණය හමුවේ අදාළ සමාගම් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කර නොමැති බව තහවුරු කර ප්‍රමිතීන්ට අනනුකූල පොහොර සැපයීම මගින් සිදු වූ පාඩුව අයකර ගැනීමට කටයුතු කළ යුතුව තිබුණත් එසේ නොකර සමාගම විසින් සමතයකට පත්වී අයකර ගත් කාර්යසාධන ඇපකර ආපසු ගෙවා තිබුණි. මෙය මතභේදාත්මක කරුණක් ලෙස නිරීක්ෂණය කෙරේ. | 2019 වර්ෂයේ වී සහනාධාර පොහොර සඳහා ආනයනය කරන ලද ටීඑස්පී තොගයක රසායනාගාර වාර්තා මත බෙදාහැරීම සඳහා ලබා දිය යුතු අලෙවි අනුමැතිය ජාතික පොහොර ලේකම් කාර්යාලය විසින් මාස 06 ක කාලයක් ප්‍රමාද කරන ලදී. එම කාලය තුල ඉහත ප්‍රමාදය නිසා දිවයින පුරා ගොවීන්ට මූලික පොහොර (මඩ පොහොර) හිභයකට මුහුණ දීමට සිදු විය. තවද ජනමාධ්‍ය මඟින් මූලික පොහොර ගොවීන් වෙත නොලැබීම සම්බන්ධයෙන් විශාල ප්‍රචාරයක් සිදු කල අතර එවකට කෘෂිකර්ම අමාත්‍යතුමා ගොවීන්ගේ ගැටළු විසඳීම සම්බන්ධයෙන් පැවති රැස්වීමක් අතරතුර ඉදිරියේදී අනුමැතිය ලැබෙන තුරු අදාළ ටීඑස්පී පොහොර නිකුත් කරන ලෙස වාචිකව උපදෙස් දෙන ලදී. ඒ අනුව මෙම පොහොර තොග බෙදාහැරීමට කටයුතු කල අතර මාස 06 කට පසු අදාළ රසායනික වාර්තාවේ එක් සංඝටකයක් (Lead) තිබිය යුතු | සමතයට පත්වීමට ක්‍රියා කළ නිලධාරීන්ට එරෙහිව පරීක්ෂණයන් පැවැත්විය යුතුය. |

ප්‍රමාණයට වඩා වැඩියෙන් ඇති බව සඳහන් කරමින් ජාතික පොහොර ලේකම් කාර්යාලය අදාළ අලෙවි අනුමැතිය ලබා නොදීමට තීරණය කරන ලදි. එකම නෞකාවේ සමාගම් කිහිපයක් විසින් ආනයනය කරන ලද එකම සැපයුම්කරුගේ ටීඑස්පී තොගයෙන් අප සමාගමට ලැබුණු පොහොර තොගවල රසායනාගාර වාර්තා
අසමත් වීමටත් අනෙකුත් සමාගම්වල රසායනාගාර වාර්තා සමත් වීම පිළිබඳ මතු වූ ගැටළුවේදී සිදු කරන ලද විමර්ශනයට අනුව රසායනාගාර වාර්තා සම්බන්ධයෙන් ජාතික පොහොර ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිළධාරින් 03 දෙනෙකුගේ වැඩ තහනම් කල අතර විමර්ශනය අවසන් වන තුරු ගිවිසුමට අනුව සැපයුම්කරු සම්බන්ධයෙන් ගැනීමට තිබූ එකම විකල්ප අවස්ථාව ඔහු සතු කාර්යය සාධන බැඳුම්කරය මඟින් මුදල් අයකර ගැනීම පමණි. ඒ අනුව සැපයුම්කරු විසින් බේරුම්කරණ ක්‍රියාවලියකට යොමු වූ අතර රසායනාගාර වාර්තාව ප්‍රමාද වීම සහ අදාළ පොහොර තොග බෙදා අවසන් කිරීම යන කරුණු මත සමාගමට නීතිමය වශයෙන් අවාසිදායක තත්ත්වයක් පවතින බවට වූ නීතිමය උපදෙස් මත අයකර ගත් කාර්යය සාධන බැඳුම්කරය නැවත අදාළ සමාගම වෙත නිදහස් කරන ලදි. තවද බේරුම්කරණය අප සමාගමට අවාසිදායක බවට වූ නීතිමය උපදෙස් මත හා මෙම බේරුම්කරණය වෙනුවෙන් දැරීමට සිදුවන අධික බේරුම්කරුවන්ගේ ගාස්තුද රාජ්‍ය අමාත්‍ය ලේකම්තුමා විසින් මෙම බේරුම්කරණය හේතුවෙන් රජයට අලාභයක් සිදුනොවන ලෙස සුදුසු පරිපාලන තීරණයක් ගැනීමට කටයුතු කරන ලෙස ලිඛිතව ලබාදුන් උපදෙස් අනුවද ඉහත තීරණයට සමාගම එළඹෙන ලදි. මේ සම්බන්ධයෙන් ඉදිරි විමර්ශන ප්‍රතිපල අනුව කටයුතු කිරීමට සමාගම අපේක්ෂා කෙරේ.

**3.6 නිෂ්කාර්යය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම සතුව ශ්‍රී ලංකා අනුකූලතාවය අගය කිරීම් පැවරීමේ මණ්ඩලයේ (Sri Lanka Accreditation Board) හි ලියාපදිංචිය ලත් රු.19,130,944 ක වටිනා රසායනාගාර උපකරණ සහිත රසායනාගාරයක් පැවතියද, සමාලෝචිත වර්ෂය තුළ සිදු කර තිබූ නියැදි පරීක්ෂණ සංඛ්‍යාව 69 ක් වන අතර වර්ෂය තුළ උපයා තිබූ ආදායම රු.278,730 කි. මෙම රසායනාගාරයෙන් ආදායමක් ඉපයීමට හැකි වන පරිදි උපාය මාර්ග සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණු අතරම මෙම නිසා රසායනාගාරය සතු සම්පත් ඌන උපයෝජිතව පැවතුණ බව නිරීක්ෂණ විය. | අප සමාගම සතු මෙම රසායනාගාරය අමාත්‍යාංශය වෙත පවරා ගෙන ලංකාවට ආනයනය කරනු ලබන සියළුම පොහොර වර්ග වල ප්‍රමිතිය පරීක්ෂා කිරීම සඳහා ස්වාධීන ආයතනයක් ලෙස ස්ථාපිත කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇති අතර එම ක්‍රියාවලිය මේ වන විට ආරම්භ කර ඇත. | රසානයාගාර සතු උපකරණ වලින් උපරිම ඵලදායීතාවයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය. |

**3.7 ප්‍රසම්පාදන කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පොහොර සැපයුම්කරුවන් සමඟ ඇතිකර ගන්නා ගිවිසුම් ප්‍රකාරව ආනයනික පොහොර තොග සඳහා බහාලුම් අංගනය දක්වා අදාළ වන සියලුම පිරිවැය සැපයුම්කරු ඉදිරිපත් කර ඇති මිලට ඇතුළත් වීම හේතුවෙන් ලිපිගොනු ගාස්තු, බහාලුම් සේදුම් ගාස්තු, වැටිබඳු හා මුද්දර ගාස්තු සැපයුම්කරුගේ දේශීය නියෝජිතයා විසින් දැරිය යුතු වේ. එහෙත් සැපයුම්කරුගේ වගකීමක් වන උක්ත කාර්යයන් නාවික නියෝජිත ආයතනයක් වෙත පැවරීම හේතුවෙන් පසුගිය වර්ෂ 2 ක කාලය තුළ එකතු වටිනාකම රු.4,222,578 ක අදාළ නොවන වියදම් සඳහා ගෙවීම් කර තිබුණි. | කන්ටේනර් බහාලුම්වලින් පොහොර ආනයනය කරනුයේ CFRCY (inco terms) යටතේය. ඒ අනුව පොහොර සඳහා මිලත් භාණ්ඩ වරාය දක්වා ගෙන ඒම දක්වා මිලත් බහාලුම් අංගනය තුළ රඳවා ගැනීම හා නැවත අදාළ ඒජන්ත වෙත භාරදීම දක්වා වැය වන වියදම් අදාළ සැපයුම්කරු විසින් දැරිය යුතු වේ. පොහොර ගෙන ඒමේදී නිෂ්කාශනය සඳහා යන වියදම් හා බහාලුම් සඳහා යථා තත්ත්වයට පත් කිරීමට සිදුවන පිරිවැය ගැණුම්කාර ආයතනය (Consignee) විසින් දැරිය යුතු වේ. ඒ අනුව භාණ්ඩ ගෙන ආ කන්ටේනර් යථා තත්ත්වය පත් කොට භාර දීම, අප සමාගම දැරිය යුතු හෙයින් මෙම වියදම අප සමාගම විසින් දරන ලදි. | සැපයුම්කරු සමග ඇතිකරගන්නා ගිවිසුම ප්‍රකාරව ගෙවීම් සිදුකළ යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) **2020/2021** මහ කන්නය තුළ වී සඳහා බෙදාදීම සඳහා සහනාධාර පොහොර ප්‍රමාණවත් නොවීම නිසා එම අඩුපාඩුව මගහරවා ගැනීම සඳහා වෙනත් බෝග සඳහා පොහොර සපයන සැපයුම්කරුගෙන් ණය පදනම මත යූරියා මෙට්‍රික් ටොන් **3,500** ක් ලබාගෙන තිබුණි. උක්ත පොහොර තොගය ලක් පොහොර සමාගම නමින් හා රජයෙන් නොමිලේ ලබාදෙන සහනාධාර පොහොර ලෙස නම් කිරීමකින් තොරව සමාගමේ ඇසුරුම් සහිතව ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී තිබීම හේතුවෙන් රජයේ සහනාධාර පොහොර අවභාවිතා කිරීම සඳහා අවස්ථාව සැලසී තිබුණි. | වී ගොවීන් සඳහා රජයේ සහනාධාර ක්‍රමය යටතේ බෙදාහරිනු ලබන රසායනික පොහොර සමහර අවස්ථාවලදී නෞකා ප්‍රමාද වීම, සමහර ටෙන්ඩර් අවලංගු වීම් වැනි හේතූන් මත සැලසුම් කළ පරිදි සමාගම වෙත නොලැබෙනු ඇත. එවැනි අවස්ථා වල වී ගොවීන් සඳහා රසායනික පොහොර හිඟයකින් තොරව බෙදාහැරීමට අධ්‍යක්ෂ, ජාතික පොහොර ලේකම් කාර්යාලයේ හා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව හුවමාරු පදනමට පෞද්ගලික සමාගම්වල ඇති අනෙකුත් භෝග සඳහා සහනාධාර පොහොර තොග වලින් ලබාගෙන (වී ගොවීන් සඳහා) නිකුත් කරනු ලබයි. මෙහිදී ලංකා පොහොර සමාගමේ ලාංඡනය මුද්‍රිත මළුවලට නැවත මළු කර නිකුත් කිරීමේදී මෙ.ටො. **01** ක් සඳහා රු.**2125/-** ක් පමණ මුදලක් අමතරව සමාගමට වැය කිරීමට සිදු වේ. ඒ අනුව මෙ.ටො. **3500** ක් සඳහා රු. මිලියන **7.4** ක අමතර මුදලක් වැය වන නිසා මෙම සිද්ධිය සම්බන්ධයෙන් පාරිභෝගික අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල් මඟින් අනුමත බෙදාහැරීම් සැලැස්මට අනුව ගොවි නාම ලේඛනයේ නම් සඳහන් ගොවීන්ට පමණක් මෙම පොහොර තොග බෙදාහැරීම විධිමත් අධීක්ෂණයක් යටතේ සිදු කරන බැවින් සහනාධාර පොහොර අවභාවිතා වීමට ඇති අවස්ථාව වැලකෙන බව දන්වා සිටිමි. | රජයේ සහනාධාර පොහොර අවභාවිතා කිරීමට ඇති අවස්ථා මගහරවා ගනිමින් ක්‍රියා කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන වලට හා දේශීය සැපයුම්කාර සමාගමක් හා ලක් පොහොර සමාගම අතර දියර පොහොර සැපයීම වෙනුවෙන් ඇතිකරගත් ගිවිසුමට අනුකූල නොවන සේ දේශීය සැපයුම්කාර සමාගම වෙත බැංකු අයිරාවක් ලබාගැනීම පිණිස 2018 වර්ෂයේදී ලක් පොහොර සමාගම සතු රු.94,438,766 ක් වටිනා ස්ථාවර තැන්පතු 02 ක් බැංකු ඇපකර ලෙස භාවිතා කිරීමට සමාගමේ කළමනාකාරීත්වය අවස්ථාව සලසාදී තිබුණි. මෙම ඇපකරය භාවිතයෙන් දේශීය සැපයුම්කාර සමාගම 2019 පෙබරවාරි 12 දින වන විට රු.75,980,000 ක බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබූ අතර එදිනට උපචිත වූ පොලිය සමග ගෙවිය යුතු මුළු මුදල රු.80,502,290 ක් වී තිබුණි. දේශීය සැපයුම්කාර සමාගම උක්ත බැංකු අයිරාව පියවීමට කටයුතු නොකිරීම හේතුවෙන් සමාගම ඇපකර ලෙස තබා තිබූ ස්ථාවර තැන්පතු දෙකෙන් හිඟ ණය ශේෂ පියවාගැනීමට බැංකුව කටයුතුකර තිබුණි. මෙම අවිධිමත් අනීතික ගනුදෙනුව හේතුවෙන් මිලියන 17 ක අහිමි වූ පොලී ආදායමක් සමග ලක් පොහොර සමාගම වෙත ජනනය වී ඇති අලාභය රු.මිලියන 97.5 ක් වී තිබුණි. | මෙමඟින් වාර්තා කර ඇති කරුණු පහත සඳහන් පරිදි නිවැරදි විය යුතු වේ. 2018 වර්ෂයේදී සමාගම සතු රු. 94,438,766/- ක් වටිනා ස්ථාවර තැන්පතු දෙකක් ඇපකර ලෙස භාවිතා කිරීමට කළමනාකාරීත්වයට සිදු වූයේ ඊට පෙර 2017.04.28 වන දින රු.මිලියන 240 ක් වටිනා ස්ථාවර තැන්පතු ඇපකර වශයෙන් භාවිතා කර රු. මිලියන 112.5 ක බැංකු අයිරා පහසුකම් සලසා දී තිබීම හේතුවෙන් එම මිලියන 240 ක ස්ථාවර තැන්පතු නිදහස් කර ගැනීමට කටයුතු කිරීමයි. අනතුරුව ඒ වන විට බැංකු අයිරාවේ හිඟ ශේෂය වූ රු. 75,980,000 ට සරිලන පරිදි වාර්තාවේ දක්වා ඇති රු. මිලියන 94 ක් වටිනා තැන්පතු ඒ සඳහා ඇපකර වශයෙන් තැබීමට 2018 ජුනි මස අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.<br>කෙසේ වෙතත් මෙම වංචාවට එරෙහිව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට , ජනාධිපති විශේෂ විමර්ශන කොමිසම සහ අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිසන් සභාව යන ආයතන මඟින් වෙන් වෙන්ව පරීක්ෂණ කටයුතු සිදු කරනු ලැබේ. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් 2017 වර්ෂයේ සභාපතිවරයා වශයෙන් කටයුතු කල අය අධිකරණයට ඉදිරිපත් කර දැනට ඇප මත නිදහස් කර ඇත. | සිදුකෙරෙමින් පවතින පරීක්ෂණ සාර්ථක කර ගැනීම සඳහා ක්‍රියා කළ යුතුය. මෙවැනි වංචා නැවත ඇතිවීම වැළැක්විය යුතුය. |
| (ඈ) | ලක් පොහොර සමාගම හා දේශීය සැපයුම්කාර සමාගමක් අතර 2017 අප්‍රේල් 17 දින ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව සපයන ලද දියර පොහොරවලින් 2021 මාර්තු වන විටත් රු.79,716,652 ක් වටිනා කල්ඉකුත් වූ පොහොර ලීටර් 109,408 ක ප්‍රමාණයක් හුණුපිටිය ප්‍රධාන ගබඩාවේ ගබඩාකර ඇති බව නිරීක්ෂණය විය. | දැනට හුණුපිටිය ප්‍රධාන ගබඩාවේ ඉතිරිව තිබෙන දියර පොහොර ලීටර් 109,408 ක ප්‍රමාණය සම්බන්ධයෙන් ඉදිරි තීරණ ගැනීම සඳහා ඒවායේ නියැදි ලබාගෙන එකී දියර පොහොර වල රසායනික සංයුතිය පිළිබඳව රසායනාගාර පරීක්ෂාවක් සිදු කර ඇත. මෙම | මෙවැනි අලාභ ඇති නොවීමට ක්‍රියා කළ යුතුය. මෙම අලාභ පිළිබඳ පරීක්ෂණයක් සිදුකර තීරණයක් ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | තොග කල්ඉකුත්වී තිබුනද රසායානාගර වාර්තාවන්ට අනුව ගුණාත්මකභාවය තුළ විශාල වශයෙන් අඩුවක් වී නොමැත. එම නිසා මේවා යත්කාලීන කොට හෝ විකුණා අලාභය අවම කර ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| (ඉ) | ලේක්හවුස් ආයතනය මගින් සමාගමේ පොදු දැන්වීම් පලකරවා ගැනීමේ ක්‍රමය වෙනස් කරමින් සභාපතිවරයාගේ ඉල්ලීමකට අනුව ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව පෞද්ගලික ප්‍රචාරණ ආයතනයක් මගින් පුවත්පත් දැන්වීම් පලකරවා ගැනීමට කටයුතු කිරීම හේතුවෙන් පූර්වයෙන් ලේක්හවුස් ආයතනයෙන් දැන්වීම් පලකරවා ගැනීමට දරූ වියදම මෙන් දෙගුණයකට අධික වියදමක් දැරීමට සමාගමට සිදුවී තිබුණි .ගිණුම් වර්ෂය තුළ පොදු දැන්වීම් සඳහා උක්ත පෞද්ගලික ආයතනය වෙත ගෙවා ඇති මුදල රු.**2,243,376** ක් විය. | ආයතනයේ ප්‍රතිපත්තියක් ලෙස වසර ගණනාවක සිට සමාගමේ සියළු දැන්වීම් ලේක්හවුස් ආයතනය මඟින් පල කිරිමට කටයුතු කරන ලදි. රෝෂණ වඩුගේ මහතා නව සභාපති ලෙස පත් වූ පසු එතුමාගේ උපදෙස් පරිදි නියෝජිත ආයතනයක් මඟින් දැන්වීම් පල කිරීම සඳහා කටයුතු කරන ලදි. නමුත් මේ වන විට **2020** වසරේ මුල සිට නියෝජිත ආයතනය හරහා දැන්වීම් පල කිරීම අත්හිටවූ අතර සියලුම දැන්වීම් සී/ස එක්සත් ප්‍රවෘත්ති පත්‍ර සමාගමට (ලේක් හවුස්) අයත් පුවත්පත් හි පමණක් ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරන ලදී. | ප්‍රසම්පාදන ක්‍රමවේදයන්ට අනුව කටයුතු කළ යුතුය. |

**3.8** මානව සම්පත් කළමනාකරණය

---

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සමාගමේ අනුමත බඳවා ගැනීමේ පටිපාටිය තුළ ඇතුළත් ලකුණු ලබාදීමේ ක්‍රමය වෙනස් කරමින් සම්මුඛ පරීක්ෂණයේදී දක්වන දක්ෂතා සඳහා අනුමත ලකුණු ප්‍රමාණය ලකුණු **25** සිට ලකුණු **60** ක් දක්වා වැඩි කරමින් තනතුරු සඳහා ඉතා වැදගත් වන ක්ෂේත්‍රයේ පලපුරුද්ද සඳහා වෙන් කර තිබූ ලකුණු **30,** ලකුණු **05** දක්වා අඩු කරමින් සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලැබ සිටි කුසලතා හා පලපුරුද්ද සහිත අයදුම්කරුවන්ට දැඩි අසාධාරණයක් ඇති වන සේ අඩු කුසලතා හා අඩු පලපුරුද්ද සහිත අයදුම්කරුවන් වෙත පෞද්ගලික වන සේ **2019** වර්ෂයේදී කළමනාරණ | එවකට කළමණාකාරීත්වය විසින් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මඟින් අදාල ලකුණු ලබා දීමේ ක්‍රමවේදය භාවිතා කර ඇති අතර බඳවා ගැනීම් පරිපාටියේ ඇතුලත් ලකුණු ලබා දීමේ ක්‍රමවේදය නොසලකා කටයුතු කර තිබේ. | පරීක්ෂණයක් සිදුකර සිදුවී ඇති අසාධාරණය නිවැරදි කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | සහකාර තනතුර සඳහා 28 දෙනෙකු බඳවා ගැනීමට සමාගමේ කළමණාකාරීත්වය කටයුතු කර තිබුණි. | | |
| (ආ) | සහනාධාර පොහොර ලබාදීමේ ක්‍රමය ක්‍රියාත්මක වන දින සිට වී වගාව සඳහා පොහොර නිකුත් කිරීමේ රජයේ නියෝජිතයා ලෙස ලක් පොහොර සමාගම කටයුතු කරනු ලබන අතර එදින සිට අලෙවි ප්‍රවර්ධනය හා අලෙවි සම්බන්ධ වෙනත් කාර්යයන් විශාල ලෙස අඩුවී ඇත. ජාතික පොහොර ලේකම් කාර්යාලයේ උපදෙස් මත ප්‍රාදේශීය පොහොර ගබඩා මගින් පොහොර නිකුත් කිරීම සිදු කරනු ලබන අතර ක්ෂේත්‍රය තුළ අලෙවිකරණ කටයුතු හා නව අලෙවි ප්‍රවර්ධන උපක්‍රම හා වැඩසටහන් ක්‍රියාත්මකවීමක් හෝ අලෙවිකරණ සුපරික්ෂණයක් ආදී කටයුතු බෙදාහැරීමේ ක්‍රියාවලිය තුළ ඇතුළත් නොවේ. ඒ අනුව අනුමත සේවක සංඛ්‍යාව සංශෝධනය කිරීම වෙනුවට සමාගම අනුමත අලෙවිකරණ කාර්යය මණ්ඩලයට අයත් දිස්ත්‍රික්ක අලෙවි ප්‍රවර්ධකයන්, ප්‍රාදේශීය අලෙවි ප්‍රවර්ධකයන්, අලෙවි ප්‍රවර්ධන නිලධාරීන් යන තනතුරුවල දිගින් දිගටම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති අතර 2021 වර්ෂයේදීද ප්‍රාදේශීය අලෙවි කළමනාකරු තනතුරු 3 ක් සඳහා වැඩ බැලීමේ පදනම මත බඳවා ගැනීම් සිදුකර තිබුණි. මේ හේතුවෙන් සමාගමට වැටුප් හා දීමනා සඳහා නිෂ්කාර්යය පිරිවැයක් දැරීමට සිදු වී තිබුණි. | අප සමාගමේ සේවක මණ්ඩල සංයුතියට අනුව ප්‍රාදේශිය කළමනාකරුවන් 09 දෙනෙකු බඳවා ගැනීමට හැකියාව ඇත. තරගකාරී වෙළඳපොල යටතේ පොහොර අලෙවි කිරීම පදනම් කරගෙන මෙම තනතුර සඳහා අවශ්‍ය නිලධාරීන් බඳවා ගන්නා ලදි. එම නිලධාරින් අතරින් නිලධාරින් තිදෙනෙකු විශ්‍රාම යෑම මත පුරප්පාඩු 03 ක් ඇති විය. එම පුරප්පාඩු පිරවීම සම්බන්ධයෙන් කළමනාකාරීත්ව තීරණය අනුව අවශ්‍ය නොවන බවත් ඉදිරියේදී තරගකාරී වෙළඳපොල තත්ත්වයක් පැවතියහොත් එම තනතුරු පිරවීම සුදුසු බවත් නිර්දේශ කරන ලදි. නමුත් මේ සම්බන්ධයෙන් වෘත්තිය සමිති නියෝජිතයන් දැනට දිස්ත්‍රික් අලෙවි නියෝජිත තනතුරු වල සිටින ජ්‍යෙෂ්ඨම නිළධාරීන් වැඩ බැලීම සඳහා පත්කරන ලෙස දිගින් දිගටම බලපෑම් කරන ලදි. අවසානයේදී මේ සම්බන්ධයෙන් සභාපතිතුමා , රාජ්‍ය අමාත්‍යතුමා, ලේකම්තුමා, වෘත්තිය සමිති නියෝජිතයින්, අප සමාගමේ මානව සම්පත් කළමනාකරු, සාමාන්‍යාධිකාරී යන නියෝජිතයින් ගෙන් සමන්විත කමිටුවක් මඟින් දීර්ග වශයෙන් සාකච්ඡා කරන ලදි. ඊට අමතරව කෘෂිකර්ම අමාත්‍යතුමා ලිඛිතවම දිස්ත්‍රික් අලෙවි නිළධාරී තනතුරේ නිළධාරින් වැඩ බැලීමේ තනතුරට පත්කරන ලෙස දැනුම් දුන් අතර ඉදිරියේදී කාබනික පොහොර ගොවීන් අතර ප්‍රචලිත කිරීමේ වැඩසටහන යටතේ ක්ෂේත්‍ර නිළධාරීන්ට විශාල රාජකාරියක් පැවරෙන බැවින් ඒ අනුව ස්ථිර නිළධාරීන් පත්වන තෙක් ජ්‍යෙෂ්ඨතම දිස්ත්‍රික් අලෙවි නිළධාරීන් තිදෙනෙකු අධ්‍යක්ෂ | අනුමත සේවක සංඛ්‍යාව අවශ්‍යතාවය පරිදි සංශෝධනය කර වැටුප් හා දීමනා අඩු කිරීමට කටයුතු කළ යුතුය. |

මණ්ඩල අනුමැතිය යටතේ අදාළ වැඩ බැලීමේ තනතුරුවලට පත්කිරිමට කටයුතු කරන ලදි.

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයට අදාළව අනුමත ස්ථිර තනතුරු පුරප්පාඩු සඳහා සේවක බඳවාගැනීමකින් තොරව මාස 06 කට වරක් සේවයේ නැවත යෙදවීමේ පදනම යටතේ අනියම් සේවකයින් 12 දෙනෙකුගේ සේවය ලබාගෙන ඒ වෙනුවෙන් රු.1,362,691 ගෙවීම් කර තිබූ අතර සමාගමේ සභාපතිවරයාගේ අනුමැතිය මත සීමාවාසික පුහුණුවන්නන් 4 දෙනෙකු බඳවාගෙන සමාලෝචිතවර්ෂය තුළ රු.2,74,850 ක වැටුප් හා දීමනා ගෙවා තිබුණි. | රජය විසින් ක්‍රියාත්මක කර ඇති සහනාධාර පොහොර බෙදාහැරීමේ වැඩ සටහන ක්‍රමවත්ව හා කාර්යක්ෂම අයුරින් ඉටුකිරීම සඳහා පුරප්පාඩුව පවතින ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ ගබඩා සහායක තනතුර සඳහා කොන්ත්‍රාත් පදනම මත 2014 හා 2016 යන වර්ෂ වලදී බඳවා ගත් සේවක හවතුන් 09 දෙනෙකු සේවයේ යොදවාගෙන ඇත. බඳවා ගැනිමේ පරිපාටියට අනුව අදාල සුදුසුකම් සපුරන ලද සේවක හවතුන් 2019 වර්ෂයේදී පවත්වන ලද ගබඩා සහායකයින් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත ස්ථිර සේවයට බඳවා ගෙන ඇත. එසේම එවකට සමාගමේ සභාපති හා ක්‍රියාකාරී අධ්‍යක්ෂ සඳහා රියැදුරන් දෙදෙනෙකු හා කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා වෙත එක් රියැදුරෙකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇත.<br>එසේම විශ්ව විද්‍යාලවල උපාධි පාඨමාලා හදාරන උපාධි අපේක්ෂක / අපේක්ෂිකාවන් වෙනුවෙන් හා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය /කෘෂිකර්ම විද්‍යාල වැනි රාජ්‍ය පුහුණු ආයතන වල පාඨමාලා හදාරණ සිසු සිසුවියන් සඳහා පුහුණු අවස්ථා ලබාදෙන ලෙසද විශ්ව විද්‍යාල පියාධිපතින් හා අදාළ ආයතන ප්‍රධානින් විසින් කරනු ලබන ඉල්ලීම් සැළකිල්ලට ගෙන, ඔවුන්ගේ අධ්‍යයන අවශ්‍යතාද සැලකිල්ලට ගෙන, අප සමාගම වෙත පැවරී ඇති සමාජ වගකීමක් සේ සලකා මාස 06ක කාලසීමාවක් සඳහා ඔවුන් වෙත අප ආයතනය තුළ ප්‍රායෝගික පුහුණුව ලබාදීමට කටයුතු කරනු ලැබේ. | අනුමත ස්ථිර තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | එම පුහුණුලාභීනගේ දැනුම හා කුසලතාවයන් ආයතනයේ ඵලදායිතාවය ඉහල නැංවීම සඳහා මනා පිටුවහලක් වන බැවින්, එම පුහුණුලාභීන් සඳහා පුහුණුවට වාර්තා කරන දිනකට රු.500/- දීමනාවක් අප විසින් ගෙවීම් කරනු ලැබේ. | |
| (ඇ) | අනුමත තනතුරු සඳහා අවශ්‍යවන පුහුණු අවශ්‍යතාවයන් හා අපේක්ෂිත ප්‍රතිඵල සම්බන්ධ ඇගයීමක් තුළින් පිළියෙළ කරන ලද වාර්ෂික පුහුණු සැලැස්මකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ වැඩ මුළු හා පුහුණු සැසි සඳහා නිලධාරීන් සහභාගී කරවීම සඳහා රු.1,671,730 ක පිරිවැයක් දරා තිබුණි. | වාර්ෂික කාර්ය සාධන ඇගයීම තුලින් පුහුණු අවශ්‍යතාවයන් හඳුනා ගන්නා අතර අදාල අංශභාර කළමනාකරුගේ නිර්දේශය මත අවස්ථානුකූලව ලබාදිය යුතු පුහුණු වැඩසටහන් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඒ සඳහා සේවක භවතුන් යොමුකිරීමට කටයුතු කර ඇත. එසේම සේවක භවතුන්ගේ දිගුකාලීන වෘත්තීය සංවර්ධනය සඳහා විධායක නිළධාරීන් හට පශ්චාත් උපාධිය හැදෑරීම සඳහා ගිවිසුම් ගතව මූල්‍ය අනුග්‍රහයන් ලබාදෙනු ඇත. | වාර්ෂික පුහුණු සැලැස්මක් සකසා පුහුණු සැසි සඳහා නිලධාරීන් සහභාගි කළ යුතුය. |

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීත්වය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ව්‍යවසාය සම්පත් සැලසුම්කරණ පද්ධතියක් (ERP System) ස්ථාපිත කිරීම සඳහා 2017 වර්ෂයේ සිට ගිණුම් වර්ෂය දක්වා එකතු වටිනාකම රු.38,176,014 ක පිරිවැයක් දරා ඇති නමුත් උක්ත පද්ධතිය සමස්ත ආයතනයම හා සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි ස්ථාපිතකොට නොතිබීම හා ස්ථාපිතව ක්‍රියාත්මකවන පද්ධතින්ද ශක්තිමත් පාලනයන්ගෙන් තොරව ක්‍රියාත්මක වීම හේතුවෙන් දරන ලද ස්ථාපනය කිරීමේ පිරිවැයෙන් හා ආසන්න වශයෙන් රු.1,580,000 ක් වන ස්ථාපිත කරන ලද ආයතනය වෙත ගෙවන වාර්ෂික නඩත්තු පිරිවැයෙන් අපේක්ෂිත ප්‍රතිඵල | සියළුම ගණුදෙනු සහ දත්ත මෙම ව්‍යවසාය සම්පත් තසමනාකරණ මෘදුකාංග පද්ධතිය මඟින් (ERP) අදාළ කාර්යයන් සිදුවන අතර, සමස්ත පද්ධතියෙන්ම 85% ක පමණ සාර්ථකත්වයක් හඳුනාගත හැක. ඉතිරි 15% ට අදාලව මෙම පද්ධතියේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් ප්‍රධාන ගැටළුව වී ඇත්තේ අප සමාගම සතු ප්‍රාදේශීය ගබඩා 24 කට අවශ්‍ය පරිගණක දෘඩාංග පහසුකම් ලබා නොදීම නිසා එම ගබඩා අදාළ පද්ධතිය සමඟ සම්බන්ධ වී නොමැත. එම ගබඩා වෙතින් ලැබෙන තොරතුරු ප්‍රධාන කාර්යාලය වෙත ගෙන්වා ගෙන තොරතුරු යාවත්කාලීන කිරිමේ ඇති ප්‍රමාදයන් මෙම දෝෂ නිර්මාණය වීමට හේතු වී ඇත. ඉතිරි ගබඩා 24 පරිගණක ජාල ගත කල පසු මෙම ගැටළුව විසදෙනු ඇත. මේ වන විට ව්‍යවසාය සම්පත් කළමනාකරණ | සමස්ත ආයතනයම හා සමස්ත ක්‍රියාවලියම ආවරණය වන පරිදි පද්ධතිය ස්ථාපිත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාගැනීමට සමාගම අපොහොසත්වී තිබුණි. | මෘදුකාංග පද්ධතිය මගින් පහත සඳහන් කාර්යයන් සම්පූර්ණ කොට ඇත.<br><br>1. Pay Roll system<br>2. Inventory Control<br>3. Attendance<br>4. Debtors<br>5. Creditors System<br>තවදුරටත් අසම්පූර්ණව පවතින කාර්යයන් වන්නේ<br>1. Accounting<br>2. Fixed Assets Control<br>මෙම ක්‍රියාකාරකම් ලබන වසරේ සිට සම්පූර්ණ කොට සම්පූර්ණ පද්ධතියම ක්‍රියාකාරීත්වයට පත් කිරීමට කටයුතු කරනු ලැබේ. | |
| (ආ) | පොහොර ලැබීම, නිකුත් කිරීම, හුවමාරු කිරීම ඇතුළු පොහොර සම්බන්ධ සම්පූර්ණ ක්‍රියාවලිය පරිගණකගත කර තිබූ නමුත් පරිගණක පද්ධතිය වෙත පෙර දිනයක යාවත්කාලීන වන සේ දත්ත ඇතුළත් කිරීමේ හැකියාව පැවතීම, අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තොග පාලනය හා සම්බන්ධ පරිගණක පද්ධතිය පිළිබඳ විගණනයේදී සෑහීමට පත්විය නොහැකි විය. | වසර අවසානයේ භාණ්ඩ තොග සමීක්ෂණ කටයුතු සඳහා රජයේ විගණන අංශයේ සහභාගීත්වය ඇතුව තොග සමීක්ෂණය කල බැවින් අවසන් තොගයේ නිවැරදි තාවය තහවුරු වී ඇති බව සඳහන් කරමි. එනමුත් ආයතනයේ ගබඩා වැඩි ප්‍රමාණයක් පරිගණක පද්ධතියෙන් තොරව අත්පොත් ක්‍රමයට තොග ලේඛන නඩත්තු වන බැවින් එම තොග යාවත්කාලීන කිරීම සිදු කරන්නේද ප්‍රධාන කාර්යාලය මගින්ය. මෙහිදී යාවත්කාලීන කටයුතුවල සුළු ප්‍රමාදයක් ඇති බව පිළිගන්නා අතර එම අඩුපාඩුවද නිවැරදි කර ගැනීමට එනම් ආයතනයේ ඉතිරි ගබඩා කිහිපයද නොබෝ දිනකින් පරිගණකගත කිරීමට කළමනාකාරීත්වය තීරණය කර ඇති බව දන්වමි. එමගින් විගණනයට අවශ්‍ය අවසන් තොග වාර්තා තොරතුරු (වඩාත් විනිවිදභාවයකින් ලබා දීමට) ලබා දීමට ක්‍රියා කරන බව ද දන්වමි. | අත්‍යාවශ්‍ය පොදු පාලනයන් හා පද්ධති පාලනයක් ක්‍රියාත්මක කළ යුතුය. |